# Abstract No 49

## “ප්‍රත්‍යක්‍ෂය” ප්‍රමාණයක් ද?

## (ථෙරවාදීය හා නෛයායික මත ආශ්‍රයෙන් කෙරෙන විමසීමක්)

**පූජ්‍ය මුවපැටිගේවෙල පඤ්ඤාලෝක හිමි**

විද්‍යොදය පිරිවෙණේ ආචාර්ය, කැලණිය විශ්වවිද්‍යාලයේ ආරාධිත කථිකාචාර්ය

ven.muwapetigewela@gmail.com,

කරුණක් අවබෝධයට ඉවහල් වන සාධකය, තරම, පමණ, මිම්ම, සම්මතය, යථාර්ථ ඥානය, සම්‍යග් ඥානය, ඉම, සීමාව, පිළිගත යුත්ත හෝ පිළිගත් සඞ්ඛ්‍යාව යනාදී විවිධ අර්ථයන්හි උපයුක්ත “ප්‍රමාණ”යන්න ථෙරවාදය තුළ මෙන් ම න්‍යාය තුළ ද භාවිතාවනුයේ සීමාසහිත අර්ථයක ය. තාර්කිකයෝ මෙන් ම නෛයායිකයෝ ප්‍රත්‍යක්‍ෂ ස්වකීය ප්‍රමාණ විග්‍රහයන්හි ආදියෙහි ම දක්වන ලදහ. යථාර්ථ ඥානය හෝ බුද්ධිය ලබාගැනීමේ ප්‍රමුඛ උපාය ප්‍රත්‍යක්‍ෂය ය යනු ඔවුන්ගේ මතයයි. එහෙත් “නිවැරදි දැනීම ලබා ගැනීමේ මිම්ම” යන අදහසින් ප්‍රත්‍යක්‍ෂය සැලකූ කල න්‍යායෙහි එන උක්ත මතය විසංවාදී වේ. එනම්ඉන්ද්‍රියමගින් ලබනසෘජුදැනීම ප්‍රත්‍යක්‍ෂයනම් තාර්කික හෝ න්‍යායික විකල්පනයක් (චින්තනයක්)එහි නොමැති බවයි.එබැවින් ඇතැමෙකුගේ මතය වන්නේ නිවැරදි ප්‍රමාණය අනුමානය බවයි.එනිසා ම එම අනුමානය ඉගැන්වෙන ශාස්ත්‍රය (තර්කය හෝ න්‍යාය)අනුමාන ශාස්ත්‍රය ලෙස ද හඳුන්වති. න්‍යාය ශාස්ත්‍රයෙහි සඳහන් ප්‍රත්‍යක්‍ෂය වෙනුවට ථෙරවාදයෙහි උපයුක්ත ප්‍රයෝගය‘සච්ඡිකිරියා’ (සාක්‍ෂාත්කරණය)යන්නයි.‘පච්චක්ඛ’ (ප්‍රත්‍යක්‍ෂ)යන්න පෙළෙහි දෙතුන්පළක දක්නට ලැබුණ ද අටුවාවන්හි දුර්ලභ නොවේ. මෙහිදී ථෙරවාදය ද “දැන ගන්නේ කෙසේ ද” යන අර්ථයෙන් ප්‍රත්‍යක්‍ෂය ප්‍රමාණයක් ලෙස හැඳින්වුව ද ‘නිවැරදි දැනීම ලබා ගැනීමේ මිම්ම’ (ප්‍රමාණ)යන අර්ථයෙන් ප්‍රමාණයක්සේ නොපිළිගනී. **(අත්ථංගතස්ස න පමාණමත්ථි (ප්‍රත්‍යක්‍ෂ කළහුට ප්‍රමාණයක් නැත) - සුත්තනිපාතය-උපසීව සූත්‍රය)**ථෙරවාද මූලාශ්‍රයයන්හි හා න්‍යාය ඉගැන්වෙන (න්‍යායබින්දු, න්‍යායසූත්‍ර, ප්‍රමාණ වාර්තික, ප්‍රමාණ සමුච්චය)මූලග්‍රන්ථයන්හි එන ඉහත සඳහන්කරන ලද කරුණු සමාලෝචනයෙන් ප්‍රත්‍යක්‍ෂය ප්‍රමාණාර්ථයෙන් (නිවැරදි දැනීම ලබා ගැනීමේ මිම්ම)සැලකිය හැකි ද යන්න විමසීම අභිප්‍රායයි.

**ප්‍රමුඛ පදඃ** ථෙරවාද, න්‍යාය, ප්‍රත්‍යක්‍ෂ, ප්‍රමාණ